වි. ක. ධර්මබන්ධු

සිංහල ඉගෙන ගන්නට කැමති සැමට සන්නස සේවාවකි මේ

හොඳ සිංහල 10

පසුගිය හොඳ සිංහල පාඩමේ අග මා දැක්වූ විභක්ති ප්‍රත්‍ය මාලාව කෙරෙහි දෙවැනි වරටත් ඔබේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

පර බසක, විශේෂයෙන් ඉංගිරිසියේ වචන සිය බසට ඇද ගැනීමේදී වර්තමානයේ පවතින දුෂ්කරතාවට පිළියමක් වශයෙනි එය ඉදිරිපත් කරන ලද්දේ.

දාර, යාර, වාර යන පද දාරය (දාර), යාරය (යාර), වාරය (වාර) යනුවෙන් වර නැගෙන්නේ 'ආ' විභක්තිය එක් වීමෙන් බව ඔබ දනිති. ඒ, 'අ' කවරයෙන් අවසන් වන (ස්වරාන්ත) පද තුනකි. එ සේ ම ගස්, මල්, කන් යන හල් අකුරකින් අවසන් වන (හලන්ත) පද තුන ගස / (ගස්), මල / (මල්), කන / (කන්), යනුවෙන් වර නැගෙන්නේත්, 'අ' විභක්තිය එක්වීමෙන් බව ඔබ දනිති. තවද,
දාරය / දාර, දාරයට / දාරවලට, දාරයෙන් /දාරවලින්, දාරයේ/දාරවල් සහ ගස/ගස්, ගසට/ගස්වලට, ගසින්/ගස්වලින්, ගසේ/ගස්වල යන නාම පද වරනැගෙන්නේ එක් ම විභක්ති එක්වීමෙන් බවත් ඔබ දනිතැයි සිතමි. එය අපේ බසේ සම්මත වියරණ රීතියකි.

එහෙත් ඒ රීතිය අනුව (CAR - කා) 'කාර්' ශබ්දය - කාර/කාර්, කාරට/කාර්වලට, කාරෙන්/කාර්වලින්, කාරේ/කාර්වල යනාදි වශයෙන් ව්‍යවහාරයක් ඇති වී නැත. එබඳු ව්‍යවහාරයක් ඇති කරන්නට වෑයම් කිරීම හාස්‍යයට හේතුවක් වනු ඇත.

(BUS - බස්) බස් ශබ්දය වුවද, බස/බස්, බසට/බස්වලට, බසෙන්/බස්වලින්, බසේ/බස්වල යනුවෙන් ව්‍යවහාර නොවේ. ඒ දෙ පදය ව්‍යවහාරයට පැමිණ අතීතේ අපේ වීරයණ රීතියට අනුව නොවේ.
කාර් ශබ්දය : කාරය / කාර්, කාරයට/කාර්වලට, කාරයෙන්/කාර්වලින්, කාරයේ/කාර්වල
සහ බසය/බස්, බසයට/බස්වලට, බසයෙන්/බස්වලින්, බසයේ/බස්වල යනු ඒ දෙ පදය අද අපේ බසේ වරනැගෙන ආකාරයයි.

මේ වැකි දෙස බලන්න.

- බසය එනවා / බස් දෙකක් ම එනවා.
- මං බසයට නැංගා / අපි බස්වලට නැංගා.
- මං බසයෙන් බැස්සා / අපි බස්වලින් බැස්සා.
- බසයේ සෙනඟ පිරිලා / බස්වල සෙනඟ පිරිලා

වැදගත් ප්‍රශ්නය මෙයයි. මේ ව්‍යවහාරය බැහැර කළ යුතු ද? පිළිගත යුතු ද? පිළිගත යුතු නම්, පවතින ව්‍යවහාරයට අනුව විභක්ති යොදා එය නොකළ හැකිය.
මෙයට යෝජනාවක් ඉදිරිපත් කරමි. බස් ඇඳුරුත් සාවධානව ඒ කෙරෙහි සිත යොමු කිරීම බසේ යහපතට හේතු වෙතැයි සිතමි.
එය මෙසේය. (මෙය අලුත් විභක්ති ප්‍රත්‍ය මාලාවකි)
බස්ද අය - බසය / බස්, බස්ද අයට - බසයට /බස්වලට,
බස්ද අයේ - බසයේ / බස්වල,
බස්ද අයෙන් - බසයෙන් / බස්වලින්

කාර්ද අය - කාරය /කාර්,
කාර්ද අයට - කාරයට/කාර්වලට, කාර්ද අයෙන් - කාරයෙන් / කාර්වලින්,
කාර්ද අයේ - කාරයේ / කාර්වල

මේ යෝජනාව ගැන සිතා බලන්න. මෙය අපේ වියරණ පොතට ඇතුළු වුවහොත් කාරේක, බස්සෙක, වෑන්නෙක, ට්‍රක්කෙක, හෝල්ලෙක යන දුවහර දුරුවනු ඇත. මේ ගැන ඔබේ අදහස ඉතා අගය කරමි.

සුභාෂිතයෙන්....

අලගියවන්න මුකවෙටි හෙවත් අලගියවන්න මොහොට්ටාල නැමැති කිවියරා විසින් ප්‍රබන්ධ කරන ලද 'සුභාෂිතය' මින් අවිරැඳු පනහකට හැටකට පමණ පෙර පාසල්. දහම් පාසල් - පිරිවෙන් ආදියෙහි භාවිතා වූ ජනප්‍රිය පුස්තකයකි. මොහොට්ටා යන පදය මහ-හෙට්ටි-රාල යන පද එක් වී සෑදුනක් යයි සිතමි.
ගුරුතුමාගේ නියමය පරිදි සතියකට කවි පහක් කට පාඩමින් කීමට එදා අපට සිදු විය. තරගයට එහි කවි ගායනා කිරීමෙන් මා දෙවැනියා වූයේ කලාතුරකිනි. කොපි පොතක් හෝ පැන්සල් කූරක් ජයග්‍රාහකයාට පිරිනැමිනි. මගේ මතකය හරි නම් මා දිනූ කොපිපොත් සහ පැන්සල් කූරු ගණන ඇතේ ඇඟිලි ගණන මෙන් තුන් හතර ගුණයකි. මා සමඟ සමුදු ඝෝෂ තාලයට සුභාෂිතයේ කවි කියා ජයගත හැකි දරුවකු හෝ මුණුබරකු නොසිටීම ගැන මගේ යටි හිත තැවෙන දුක්වන අවස්ථා එමටය.
ඕස්ටේලියාවේ සිංහල දරුවන්ගේ දැන ගැනීම සඳහා අද පටන් සුභාෂිතයේ එක් එක් කවිය පිළිවෙළින් ඉදිරිපත් කරමි. වැඩිහිටියකුගෙන් අසා සමුදු ඝෝෂ තාලය ඉගෙන ගන්නා ලෙස දරුවන්ගෙන් ඉල්ලා සිටිමි.

1. සත වෙත පත මෙත සඟ හස සෙවි පසිඳු
අවනත සුර මත මිනි හර සර පුබුදු
දිගුරත ගිලි දල පෙල මොක් සුවඳ රැඳු
සියපත සිය සිය පත සියපත නමඳු

සෙවි - තමන් සේවනය කල / තමන් ලඟට පැමිණි,
සත වෙත - සත්වයා / ජනයා කෙරෙහි,
මෙත - මෛත්‍රිය / කරුණාව ඇති ,
පසිඳු - ප්‍රසිද්ධ
සඟ හස - සංඝයා නැමැති හංසයන් ඇති,
අවනත - තමන්ට වැඳීම පිනිස තමා දෙසට නැමුනු,
සුර - දෙවියන්ගේ ,
මත - හිස් මුදුනෙහි වූ,
මිනි - මැනික්වල තර - රශ්මිය / කාන්තිය නැමැති,
සර - විලේ,
පුබුදු - පිපුනු, දිගු රත් ඇඟිලි - දික් වූ රතු පාට ඇඟිලි නැමැති,
දල ශල - පෙති / පත්‍ර පන්ති ඇති,
මොක් - නිවන් නැමැති, සුවඳ - සුවඳ/සුගන්ධය,
රැඳු - රැඳුනු/දරාසිටි,
සියපත සිය සිය - සූර්ය ඥාතීනුගේ / හිරුගේ නෑයන්ගේ / බුදුන්ගේ, පත - පාද නැමැති, සියපත - නෙලුම්, නමඳු - වඳින්න.

පද ගැලපුම ඉරි ඇඳි පද අනුව තේරුම් ගන්න. මෙහි ණ / ළ ඉවත් කල බව සලකන්න.

22 පිරෙන්

කණ්ඩායමේ නර්තන ශිල්පියෙක් විදිහට... උඩරට නැටුම් සම්ප්‍රදායට තමයි මගේ හුරුව තිබුණෙ. වන්තම් ගායනයේදී මගේ ගායනා අංශයත් දියුණු වුණා. ජනප්‍රිය නොවුණාට ඒ දවස් වල කරපු සින්දු ගුවන්විදුලියේ දෙවන සේවයේ, රජරට සේවයේ එහෙම ප්‍රචාරය වුණා. සරණ ගී පරීක්ෂණයෙන් ඒ ශ්‍රේණියේ ශිල්පියෙක් විදිහට සමර්ථවෙලයි මං හිටියෙ.

දියතලාවේ පැවැත්වුණ සාහිත්‍ය උත්සවයකදී මගේ ගායන හැකියාවන් දැකපු තිස්ස අබේසේකර මහත්තයත් දයානන්ද ගුණවර්ධන මහත්තයත් ඒ ගැන පැහැදිලා ප්‍රශංසා කළා. ආනන්ද එස් විජේසිරි මහත්තයාගේ නෙත් ඇද බිසව් කියන වේදිකා නාට්‍යයේ පොතේ ගුරාගේ චරිතයට මට ආරාධනයක් ලැබුණා. නාට්‍යයේ සංගීතය තිර්මාණය කළ ඔස්ටින් මුණසිංහ මාස්ටර් මගේ ගායනා ගැන බොහොම සතුටු වුණා. හොඳ සිංහල හඬත්... නාට්‍යය බලපු තිස්ස අබේසේ-'කර මහත්තය කිව්වා.

ඔහොම ඉතින් කාලයක් ගියා. ඔය ඉන්නකොටයි මට මුණසිංහ මාස්ටර් ගෙන් ආරාධනාවක් ආවෙ චිත්‍රපටියකට සින්දුවක් කියන්න. මාත් බොහොම ආසාවෙනුයි උන්නෙ චිත්‍රපටයක සින්දුවක් තියා. . මාස්ටර් කියපු තාලයට මාත් මං දන්න දන්න කෑලි දැම්මා ගායනාවෙදි..
ටික කාලයකට පස්සෙ යාලුවො මට කියනවා ..ටීයෙ ටෙලියක සින්දුවක් ඇහුවා.. මරු මචං.. කියලා. .. උඹේ සින්දුවක්.. ළඟන සතියෙත් යනවා.. අහලා බලපන් නැද්ද කියලා..

ඒත් ඉතින් මට අප්සෙට්.. ඇයි චිත්‍රපට සින්දුවක් නෙවෙයි නෙ... වේරේ හඬ නගා සිනාසුනා... සින්දුව අහපු හුඟ දෙනෙක් කිව්වා අලුත් හඬක් ය කියලා. කොහොම හරි 1997 අවුරුද්දේ සුමති ටෙලිනාට්‍ය සම්මාන උළෙලේ දී හොඳම ගායකයාට හිමි සම්මානය ලැබුණේ මට.
තිස්ස අබේසේකරගේ වනසරණ ටෙලිනාට්‍යය සඳහා තිස්සයන් විසින්ම රචිත මෙම ගීය සිවර ගැන්වූයේ ඔස්ටින් මුණසිංහ සංගීත වේදියාණන්. වැදි බස් වහර හා එම නාද මාලා ඇසුරින් රචිත මේ ගීයේ පද වැල ඉතාමත්ම කෙටි වූවක්.

ආදරයෙන්, උගන්දුවෙන්, භක්තියෙන් යම් කෙනෙක් යම් දෙයක් කරනවානම් මොනම දෙයක් කළත් ඒකට හිසි තැන ලැබෙනවා. ධන බලය, කුලය, හිලය සොයාගෙන යන්න ඕනෙ නෑ... සේනානයක කියා සිටියා. ජනප්‍රියත්වය ප්‍රසිද්ධිය අඹා යන නවකයනට අගනා උපදෙසකි ඒ.
(සම්බන්ධීකරණය කළ ප්‍රසන්න කුරුකුලරත්න සොයුරා ට තුති)

නංගිට බැඳපු මල් වියනයි
නංතිට බැඳපු - නංගිට බැඳපු - නංගිට
බැඳපු මල් වියනයි
තාරා වෙල් පිට යග්ගංමෙල්
අපටත් කියාලයි නාටාන්නේ
මාමි තොටේ - පැණි කනවෝ
තෝටා කන්නයි මං ආවේ

තෙන් තෙදිනානේ
තෙදිනානේ

KANDY LUBE
SERVICE CENTRE

All Mechanical Repairs
Electrical
RWC
Full Car Detailing

QUALITY SERVICE

Jagath JE - Sannasa

MAHINDALAL HEWAWASAM
KANDY LUBE SERVICE CENTRE
2/40 STRONG AVENUE
THOMAS TOWN 3074
MELWAY 8G10

PH : 03 9462 2199
FAX : 03 9462 2166
Mo : 0413 421 625